# සීමා නිර්ණය ගැටලු රහිත පළාත් පාලන ආයතනවල ඡන්දය පවත්වන්න - පැෆරල් ඉල්ලයි

■ එච්.අයි. තුෂාර



සීමා නිර්ණයට අදාළ ගැටලු රහිත පළාත් පාලන ආයතනවල මැතිවරණය පවත්වන ලෙස පැෆරල් සංවිධානය පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතාට ලිපියක් යවමින් ඉල්ලා සිටි බව එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

පළාත් පාලන මැතිවරණය කඩින්කඩ පැවැත්වීම සුදුසු නොවුණද, බොහෝ පළාත් පාලන ආයතනවල නිල කාලය වසරකට වැඩි කාලයක සිට අහෝසි වී යාම නිසා එම ආයතන තුළ මහජන නියෝජිතයන් නොමැති බවද ඔහු පවසා සිටියේය.

නිලධාරීන් යටතට පත් වී ඇති පළාත් පාලන ආයතන කිහිපයක නිලධාරීන් ජනතා අවශ්‍යතා ඉටු කරමින් සිටියද බහුතර ආයතනවල එම තත්ත්වය දැකිය නොහැකි බවද හෙතෙම සඳහන් කළේය.

මේ අනුව ජනතාවගේ අවශ්‍යතා පැත්තෙන් බැලුවද, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය පැත්තෙන් බැලුවද බරපතළ ගැටලුවක් පවතින බවත්, මේ නිසා සීමා නිර්ණ ගැටලු නොමැති පළාත් පාලන ආයතනවල මැතිවරණය පවත්වන ලෙසට ඉල්ලමින් අමාත්‍යවරයාට ලිපියක් යැවූ බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා පවසා සිටියේය.